**ශීර්ෂය 266- වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී . 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ .සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇතවංචා සහ වැරදි තනි . මාණාත්මකහෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍ර සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික පනතේ 6 (I) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිලිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1. 6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපළ, පරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 විසින් භාවිතයෙන් ඉවත් කර තිබූ තොග අයිතමයන් 484ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉවත් කළ වර්ග අඩි 2,670ක ගොඩනැගිල්ල යනාදියෙහි පිරිවැය මූල්‍ය නොවන වත්කම්වලින් ඉවත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය වෙන වෙනම තක්සේරු කිරීමට කටයුතු කරමින් පවතී. ඉන් පසුව විනාශ කළ වර්ග අඩි 2670 ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම CIGAS මගින් ඉවත් කරනු ලැබේ. | ඉවත් කරන ලද මූල්‍ය නොවන වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විදුලිය සවිකිරීම් ලේඛනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විධිමත්ව යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලිය සවිකිරීම්වල භාණ්ඩ ලේඛනය මේ දක්වා විධිමත්ව පවත්වා නොතිබුණත් ඉදිරියේදී මෙම ලේඛනය නිසි රෙගුලාසි ප්‍රකාරව විධිමත්ව පවත්වාගනු ලැබේ. | මුදල් රෙගුලාසිවල සඳහන් පරිදි විධිමත්ව ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වෙනත් අමාත්‍යාංශ 10ක් සහ දෙපාර්තමේන්තු 05ක් විසින් ලබාදුන් එකතුව රු.234,442,571ක මූල්‍ය ප්‍රතිපාදනවලින් එකතුව රු.234,169,769ක මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබූ අතර එම ඉතිරිවීම් සියයට 18 සිට සියයට 100ක් දක්වා පරාසයකින් පැවැතුණි. | රටෙහි පැවැති ආර්ථික අර්බුදය හේතුවෙන් සහ අයවැය චක්‍රලේඛයට අනුකූලව නිදහස් කරතිබූ ප්‍රතිපාදනවල ඉතිරිවීම් පැවැතුණි. | අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි පරිදි මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

#### 2.1.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි . | ඉදිරි කාලයේදි සිදුකිරීමට පියවර ගනු ලැබේ | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 2.1.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව, වවුනියා උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන අනතුරෙන් සිදුවූ පාඩුවල එකතුව රු.217,500ක් ඒ සඳහා වගකිව යුතු වාහන රියැදුරුගෙන් අයකර ගැනීමට පසුගිය වර්ෂ 13ක සිට එලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 මැයි මාසයේ සිට රියැදුරුගේ වැටුපෙන් අයකර ගැනීමට පියවර ගෙන ඇත. | පාඩු නියමිත පරිදි නිරවුල් කර ගැනීමට කටයුතු කළයුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

### 3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම අත්කර නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරමින් පැවැති කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ගර්භනී මව්වරුන් සඳහා රු.2,000ක් මාසිකව ලබාදීමේ පෝෂණ වැඩසටහනට අමතරව සමාලෝචිත වර්ෂයේදී කාන්තා සහ ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ 2022 ඔක්තෝබර් 14 දිනැති අංක 6/2022 දරන කාන්තා හා ළමා කටයුතු චක්‍රලේඛය ප්‍රකාරව කිරිදෙන මව්වරුන්ට රු.2,500ක් වැඩිපුර ගෙවීම් මුදලක් 2022 සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා මාස 04ක් කාලයක් සඳහා ගෙවීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇති අතර ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීමේ වගකීම දිස්ත්‍රික් ලේකම්වරයාට හා ප්‍රාදේශීය ලේකම්වරයාට භාරදී තිබුණි. එසේ වුවත්, අඩුබර ළදරුවන්ගේ සංඛ්‍යාවෙහි උපත් සංඛ්‍යාව 2020, 2021 සහ 2022 වර්ෂවල පිළිවෙලින් 236, 245 සහ 290ක් වශයෙන් ඉහළයමින් පැවැතීම නිරීක්ෂණය විය. | ගර්භනී මව්වරුන්ගේ අයැදුම්පත්‍ර Ptlm, MOH ග්‍රාම නිලධාරී යන අයගේ අත්සන් ලබාගෙන නියමිත කාලයේදී භාරදෙනු නොලැබේ. එසේම, මුද්දර සඳහා අයැදුම් පත් ලබාදුන් නමුත් ඒවා නිකුත් කිරීමේ ප්‍රමාදයන් පවතී. | චක්‍රලේඛය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට පියවර ගතයුතු වේ. |

### 3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අමාත්‍යාංශයේ ග්‍රාමීය නිවාස පුනර්ජීවන වැඩසටහන යටතේ සලසා තිබූ ප්‍රතිපාදනවලින් පවුල් 2610 ක් සඳහා 2015 වර්ෂයේදී ඉදිකර ලබාදුන් නිවාසවලින් මේ දක්වා නිවාස 64ක් පදිංචිය සඳහා භාවිතයට නොගෙන අත්හැර දමා තිබුණි. | දැන්වීම් පත්‍රිකා අලවා ප්‍රතිලාභීන් පදිංචි කරවීමේ ප්‍රයත්නයන් අඛණ්ඩව ගනිමින් පවති. | නිවාස භාරදී තිබූ ප්‍රතිලාභීන් එහි පදිංචි වී අදාල අරමුණු සඳහා භාවිතා කිරිම සනාථ කිරිමට පියවර ගතයුතු වේ. |
| (ආ) | 2018 වර්ෂයේ අයවැය යෝජනා අනුව එකතුව රු.291,639,356ක පිරිවැයකින් ඉදිකර තිබූ වවුනියා ආර්ථික මධ්‍යස්ථානය මේ දක්වා මහජනතාවගේ භාවිතය සඳහා විවෘත කර නොතිබුණි. කෙසේ වෙතත්, එම මධ්‍යස්ථානය වෙනුවෙන් ආරක්ෂක සේවා, පිරිසිදු කිරීමේ සහ ජල ගාස්තු ආදියෙහි එකතුව රු.5,865,128ක් පසුගිය වර්ෂ 05ක කාලයක සිට ගෙවා තිබුණි. | ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලැබූ වහාම භාවිතයට ගැනීමට පියවර ගනු ලැබේ. | අදාල අරමුණ වෙනුවෙන් භාවිතා කිරීමට පියවර ගතයුතු වේ. |

### 3.1.3 ව්‍යාපෘති ඉටුකිරිමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වර්ෂයේදී නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය විසින් වවුනියා දිස්ත්‍රික්කයට වැසිකිළි 456ක් ඉදිකිරීමේ කාර්යයට ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදනවලින් වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.700,000ක් ප්‍රතිපාදන සලසා තිබූ වැසිකිළි 10ක් මේ දක්වා ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි. | අක්මුදල් ලැබූ විගස අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. | අක්මුදල් ලබාගෙන කඩිනමින් වැසිකිළි පද්ධති ඉදිකිරිමට සුදුසු පියවර ගතයුතු වේ. |

### 3.2 වත්කම් කළමනාකරණය

### 3.2.1 නිෂ්කාර්ය සහ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අළුත්වැඩියා කර භාවිතයට ගතහැකි තත්ත්වයේ පැවැති යතුරුපැදි 19ක් අනාරක්ෂිතව හා නඩත්තුවකින් තොරව පසුගිය වර්ෂ 02 සිට 07ක් දක්වා කාලයක් නැවතුම් පලෙහි ගාල්කර තිබුණි. | හිමිකාරිත්වය මාරුකිරීමෙන් පසුව ආපසු නිලධාරීන්ට මෙන්ම වෙනත් දෙපාර්තමේන්තුවලටත් ලබාදීමට පියවර ගනු ලැබේ. | වාහන භාවිතය සම්බන්ධයෙන් ඵලදායී පියවර ගතයුතුවේ. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ළගා කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ළඟාකර ගතහැකි ඉලක්ක සහ එම ඉලක්ක ළඟාකර ගැනීමේදි පවතින පරතරයේ කාර්යසාධනයේ ප්‍රගතිය මැනීම සඳහා සුදුසු දර්ශක ස්ථාපිත කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරි කාලයේදි අදාල දර්ශක ස්ථාපිත කර ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ | තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සුදුසු පියවර ගත යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ තෘතියික මට්ටම්වල පිළිවෙලින් පුරප්පාඩු 04ක් සහ 09 ක් පැවැතිණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ තෘතියික මට්ටම්වල පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට මාසිකව දත්ත ඇතුළත් කරනු ලැබේ. | පුරප්පාඩු කඩිනමින් පුරවා මහජනතාවට විශිෂ්ඨ සේවාවක් සැපයීමට ක්‍රියාමාර්ග ගතයුතු වේ. |